# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 6 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)



ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 6 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

ක්‍රිස්තියානි ධර්මය

6 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015
ජාතික අධ්‍යාපන ආයතනය
ISBN

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය.

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය**
: ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

: ගරු රෙක්ස් කොන්ස්ටන්ටයින් පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

**උපදේශක මණ්ඩලය:**

අතිගරු ඩිලෝරාජ් කනගසබේ රදගුරුතුමා
ලංකා සභාව, කොළඹ දියෝකීසිය.

අතිගරු ශාන්තා ෆ්‍රැන්සිස් රදගුරුතුමා.
ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය.

අතිගරු ආචාර්ය ඩැනියල් එස්. ත්‍යාගරාජා රදගුරුතුමා.
දකුණු ඉන්දියානු සභාව.

ගෞ. ආචාර්ය ඒ. ඩබ්. ජෙබනේසන් දේවගැතිතුමා.
මහනායකතුමා, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව.

ගෞ. ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා.
සංගමාධිපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

ගෞ. චාර්ලි ජෑන්ස් දේවගැතිතුමා.
සභාපතිතුමා, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව.

ගෞ. සමන් පෙරේරා දේවගැතිතුමා.
ප්‍රෙස්බිටීරියන් සභාව.

කොමිෂනර් මැල්කම් ඉඳුරුවගේ.
ප්‍රාදේශීය මූලිකතුමා, ගැළවීමේ හමුදාව.

ගෞ. ඩබ්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා.
මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.

ගෞ. හේෂාන් ද සිල්වා දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

එම්. සභාරංජන් මහත්මිය.
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය.

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.

ගෞ. විලියම් විජේකෝන් දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

**ලේඛක මණ්ඩලය** : ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.
දේවධර්මවේදී, දිව්‍ය ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය)

එල්. නිලන්ති දීපා ද සිල්වා මිය.
බප/පිලි/මෙතොදිස්ත උසස් විදුහල - මොරටුව.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය), පුහුණු ගුරු (ක්‍රිස්තියානි ධර්මය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය.
ශා. තෝමස් විදුහල - ගල්කිස්ස.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය, ක්‍රිස්තු ධර්මය, සිංහල)
අධ්‍යාපනපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

අරුණි ඉන්දිකා පෙරේරා ජයතුංග මිය.
බිෂොප් විදුහල, කොළඹ - 3.
දේව ධර්මවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. රේණුකා දමයන්ති මිය.
කු/ මාවතගම මධ්‍ය මහ විද්‍යාලය - කුරුණෑගල.
ශාස්ත්‍රවේදී උපාධි, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. පී. සෙල්වනිදි පෙරේරා මිය.
වෙස්ලි විදුහල, කොළඹ - 8.
විශ්‍රාමික ගුරු උපදේශක (ක්‍රිස්තියානි ධර්මය), පුහුණු ගුරු (විද්‍යාව)

ඩී. ස්ටෙලා දර්ශනී මෙනවිය.
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.
දේවධර්මවේදී.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ක්‍රිස්තියානි ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවාගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබාගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. අධ්‍යාපනය තුළින් හදවත හා අතද පෝෂණය කළ යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පෙළ පොතට හා විෂය නිර්දේශයට අනුරූපව ලියා ඇත. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු කර ගැනීමට වගබලා ගත යුතුය.

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් ඵල වලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකිය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතුය. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලා ඇතිව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිතය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරු භවතා පංති කවවලදී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතුය.

**ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා**
ව්‍යාපෘති නායක
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iv |
| විෂය මාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix - xxi |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 45 |
| විවිධ සහය | 46 |

## විෂය හැඳින්වීම

යහ ගුණ පිරි සමාජයක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාව ය වේ. ඒ සඳහා ආගම මගින් සුවිසල් මෙහෙවරක් ඉටු කරයි. එවන් සමාජයක් කරා දරුවන් ප්‍රවිශ්ඨ කරවීම ආගමික විෂය මාලා ප්‍රතිසංස්කරණයේ අභිප්‍රායයි. පරිපූර්ණ දරුවකු තුළ දැනුම, ආකල්ප, කුසලතා පමණක් නොව අන්තර් පුද්ගල හැකියාවන් හා යහ ගුණ වර්ධනය කිරීම ද අපේක්ෂිත ය.

දරුවකුට දේව රාජ්‍යයේ ප්‍රතිපත්තීන්ට හා ගුණාංගවලට අනුකූල ව තම කිතුනු විශ්වාසය හා ඇදහිල්ල සවිමත් කර ගනිමින් ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය තුළ විදහා දැක්වීම සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සම්පාදනය කර ඇත.

ශුද්ධ බයිබලය තුළින් එළි දැක්වෙන දේව වචනය පදනම් කර ගනිමින් විශේෂිත වූ කිතුනු දැක්ම, පැවැත්ම හා සත්‍යතාවන් මත ප්‍රධාන නිපුණතා පහක් පාදක කර ගනිමින් 6-11 ශ්‍රේණි සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සකසා තිබේ.

11 වන ශ්‍රේණිය අවසාන වන විට තමා දිවි ගෙවන සමාජය තුළ පැන නැගෙන අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කරන හා ක්‍රිස්තුස් වහන්සේ තුළ තම ජීවිතය ගත කරන, සමාජය ආලෝකවත් කිරීමට හැකි දේව විශ්වාසයෙන් පරිපූර්ණ, නව යොවුන් කිතුනුවකු ලොවට දායාද කිරීම මෙම විෂය මාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශිෂ්‍ය කේන්ද්‍රිය සන්දර්භයක් හරහා ජීවිතාදර්ශයෙන් ක්‍රියා කරමින්, කිතුනු අනන්‍යතාවය දරන දේව රාජ්‍යයේ පුරවැසියන් පිරිසක් බිහි කිරීමට ඇප කැප වී ක්‍රියා කිරීම කිතුනු දහම් ගුරුවරයකුගේ මහඟු වගකීමයි. මේ සඳහා සිසුන් තුළ අදාළ නිපුණතා වර්ධනය කිරීමටත් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සංකල්ප හා ක්‍රියාකාරකම් සාර්ථක ලෙස යොදා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

කිතුනු සාක්ෂිය හා ස්ථිර සාර ඇදහිල්ල පෙරදැරි කරගත් ශ්‍රී ලාංකේය ජන ජීවිතය සවිමත් කරන හා ලොව නංවන විජයග්‍රාහී කිතුනුවන් රැසක් නිර්මාණය කිරීමට මෙම ක්‍රියාදාමය හරහා අවකාශ ලැබෙනු නො අනුමානය.

**ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු**

**ජාතික පොදු අරමුණු**

පුද්ගලයාට හා සමාජයට අදාල වන ප්‍රධාන ජාතික අරමුණු කරා ලඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම් වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ලඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහු විධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාවය, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමයේ ප්‍රවර්ධනය කිරීම තුළ ජාතිය ගොඩ නැගීමේ සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කිරීම.
2. වෙනස්වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන ජාතික උරුමයේ මා හැඟි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ්වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයනට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප සහ කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා** — සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** — සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන් චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** — ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** — සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** — අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

1. දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද, නිර්මාතෘ ද බව විශ්වාස කරමින් උන්වහන්සේ අපට දුන් දේව දායාදයන් ප්‍රයෝජන ගැනීමටත්, සුරැකීමටත්, සංරක්ෂණය කිරීමටත් ක්‍රියා කරයි.

2. යාච්ඤාවෙන් සවිමත් වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත ප්‍රේමය අත්දකිමින් සමාජය ආලෝකවත් කිරීමට කටයුතු කරයි.

3. ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් තම දක්ෂතා, හැකියා යහපත් සමාජ මෙහෙවරකට හා ජාතික සංවර්ධනයට යොමු කිරීමට ක්‍රියා කරයි.

4. ජාතික හා අන්තර් ආගමික සුහදතාවය වර්ධනය කර ගනිමින් සාර ධර්මයෙන් හෙබි සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දේව රාජ්‍යයේ වටිනාකම් පිටිවහලක් කර ගනියි.

5. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට දේව වචනය අත්වැලක් කර ගනියි.

6. පරිණත කිතුනු ජීවිත ක්‍රියාකාරීත්වය තුළින් ක්‍රිස්තුස් වහන්සේ ලොවේ මාංශවත් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 01. දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි. | **6.1.1 දෙවියන් වහන්සේ මනහර දේව නිර්මාණයේ මැවුම්කරුවාණෝ බව අත්දකියි.** | 6.1.1 දෙවියන් වහන්සේ ලෝකය මැවීම (උත්පත්ති1:1-31-2:1-3) (දෙවියන් වහන්සේගේ මැවිල්ලේ මනහර බව හා විශිෂ්ටත්වය) | • දින හය තුළ දෙවියන් වහන්සේ මවන ලද දේ පිළිබඳව තොරතුරු පිළිවෙළින් ගොනු කරයි<br>• දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව පිළි ගනියි.<br>• චිත්‍රයක් මගින් දේව මැවිල්ල ඉදිරිපත් කරයි<br>• මනහර මැවිල්ල ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි.<br>• සාමූහිකව දෙවියන් වහන්සේට තුති පුදමින් නමස්කාර කරයි | 2 |
| | **6.1.2 දෙවියන් වහන්සේ විවිධ අගනා දේව නිර්මාණ සපයා දුන් බව අවබෝධ කර ගනියි.** | 6.1.2 සාගර, ගංගා, දියඇලි ,තුරුලතා, ආකාශ වස්තු, ජීවමාන සත්ත්ව ලෝකය, ඇතුළු අනෙකුත් දේව නිර්මාණ (උත්පත්ති 1:6-25) | • මැවිල්ල තුළින් දෙවියන් වහන්සේ සපයා දී ඇති ආකාශ වස්තුන් හා සත්ත්ව ලෝකය වගු ගත කරයි.<br>• ගස්වැල් හී වර්ධනය දෙවියන් වහන්සේගේ ක්‍රියාවලියක් බව පිළිගනියි.<br>• අවබෝධයෙන් යුතු ව ප්‍රශ්න වලට පිළිතුරු සපයයි.<br>• මැවිල්ල තුළින් දේව මහිමය ප්‍රකාශ වන බව විශ්වාස කරයි.<br>• දෙවියන් වහන්සේ ලබා දුන් අගනා දේව නිර්මාණ පිළිබඳව එක්ව තුති පුදයි | 2 |
| | **6.1.3 දේව මැවිල්ල පිළිබඳ තුති පුදමින් එහි සංරක්ෂක භාරකරුවන් ලෙස ක්‍රියා කිරීමට පෙළඹෙයි.** | 6.1.3 දේව නිර්මාණයේ මුදුන් මල්කඩ මිනිසා. (මැවිල්ල තුළ දරුවාගේ විශිෂ්ඨත්වය හඳුන්වන්න) අගනා දේව නිර්මාණයේ ප්‍රයෝජන ලැබීම හා තුති පිදීම. (ගීතාවලිය 19: 1-2) මිනිසා දේව නිර්මාණයේ සංරක්ෂක භාරකරු (උත්පත්ති1:27-28,2: 15) (කිතුනු සිසුවකු ලෙස ස්වභාවික උවදුරු අවම කිරීමට හා ඉන් වැලකීමට ක්‍රියා කල හැකි ආකාරය අවධාරණය කරන්න.) | • මිනිසා දේව නිර්මාණයේ මුදුන් මල්කඩ බවට තොරතුරු ගොනු කරයි.<br>• දේව මැවිල්ල සංරක්ෂණය කිරීම අවශ්‍ය බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක පෝස්ටර් මගින් මැවිල්ල පිළිබඳව තම වගකීම් ඉදිරිපත් කරයි.<br>• දෙවියන් වහන්සේ දුන් තම ජීවිතය ලොව තුළ සුරක්ෂිත කර ගත යුතු බව විශ්වාස කරයි.<br>• පරිසරය සුරැකීමට සාමූහික ව කැප වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 02.<br>ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි. | **6.2.1**<br>**ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂි බව වටහා ගනියි.** | 6.2.1<br>ජේසුස් වහන්සේගේ උපත. උපත මරියතුමියට දැනුම් දීම. (ශු. ලූක් 1: 26-31)<br>උපත (ශු. ලූක් 2: 1-7)<br>එඬේරුන් හා ශාස්ත්‍රවන්තයන්ට දැනුම් දීම. (ශු. ලූක් 2: 8-20, ශු. මතෙව් 2: 1-12) | • ජේසු උපත පිළිබඳ තොරතුරු ගොනු කරයි<br>• ජේසුස් වහන්සේ ගැළවුම්කරුවාණන් බව පිළිගනියි<br>• ජේසු උපත නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි<br>• නිහතමානී ව දේව හඬට කීකරු වෙයි.<br>• සාමූහික ව දෙවියන් වහන්සේට තුති පුදමින් නමස්කාර කරයි. | 4 |
| | **6.2.2**<br>**ජේසුස් වහන්සේගේ ළමා කාලය තම ජීවිතයට ආදර්ශයක් කර ගනියි.** | 6.2.2<br>ජේසුස් වහන්සේගේ ළමා කාලය<br>(ශු. ලූක්2: 39-40, 2:41-52) | • ජේසුස් වහන්සේ අවුරුදු 12 දී පාස්කු මංගල්‍යය සැමරීම පිළිබඳ විස්තර කරයි.<br>• ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගේ ප්‍රසාදය දිනා ගනිමින් කටයුතු කළ බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ව සඟරාවකට ලිපියක් රචනා කර ඉදිරිපත් කරයි<br>• ජේසුස් වහන්සේ මෙන් දේව සබඳතාවයෙන් යුතුව ජීවත් වෙයි.<br>• කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කරයි. | 2 |
| | **6.2.3**<br>**ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා කුරුසි පත්වීම පිළිබඳ සිදුවීම් අධ්‍යයනය කරයි.** | 6.2.3<br>ජේසුස් වහන්සේගේ දුක්විඳීම හා කුරුසිපත් වීම<br>(ශු. මතෙව් 27: 32-50) | • ජේසුස් වහන්සේ කරුසිපත් වීමට පෙර සිදුවීම් පෙළ ගස්වයි.<br>• අපගේ පාපය උදෙසා ජේසුස් වහන්සේ තම දිවි පුද කළ බව පිළි ගනියි.<br>• බිත්ති පුවත් පතකට නිර්මාණාත්මක ලිපි පෙළක් ඉදිරිපත් කරයි.<br>• ජේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් ගැලවීම ලද බව විශ්වාස කරයි.<br>• දෙවියන් වහන්සේට තුති පුදමින් දිවි ගෙවයි.. | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | **6.2.4 ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් ආලෝකයක් ලබයි.** | 6.2.4 පුනරුජ්ජීවනය (නැවත නැගිටීම/ උත්ථානය) (ශු.මතෙව් 28:1-10) | ● ජේසුස් වහන්සේගේ නැවත නැගිටීමට අදාළ සිද්ධීන් පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ තෙදිනකින් නැවත නැගිටි බව පිළිගනියි.<br>● ජේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ සිදුවීම නිර්මාණාත්මක දෙබසක් ලෙස ඉදිරිපත් කරයි.<br>● උන්වහන්සේගේ නැවත නැගිටීම තුළ අපට නව බලාපොරොත්තුවක් ඇති බව විශ්වාසයෙන් කථා කරයි.<br>● උත්ථානයේ පණිවුඩය අන් අයට ප්‍රකාශ කරයි. | 2 |
| | **6.2.5 ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ සිද්ධීන් පෙළගස්වයි.** | 6.2.5 මග්දලායේ මරියා (ශු ලූක් 24:1-12) එම්මාවුස් ගමන (ශු. ලූක් 24:13-40) | ● ජේසුස් වහන්සේ උත්ථානය වූ බවට සාක්ෂි ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ උත්ථානය වූ බව පිළිගනියි.<br>● ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ සාක්ෂි දැරූවන්ගේ අදහස් නිර්මාණාත්මක පෝස්ටරයක් තුළින් ඉදිරිපත් කරයි.<br>● ජේසුස් වහන්සේ නැවත නැගිටි බව විශ්වාස කරයි.<br>● උන්වහන්සේගේ උත්ථානය පිළිබඳව සාක්ෂි දරයි. | 4 |
| | **6.2.6 ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනයේ ජයග්‍රහණය තම ජීවිතයට අත්පත් කර ගනියි.** | 6.2.6 පුනරුජ්ජීවනය සදාතන ජීවනයට මග බව පහදන්න. | ● ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය, සදාතන ජීවනයට මග බවට කරුණු ගොනුකරයි.<br>● දේව සබඳතාවයට ඇතුලත් වීම තුළින් සදාතන ජීවිතය හිමිකරගත හැකි බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ලිපි, නිසඳැස්, කවි ඉදිරිපත් කරයි.<br>● ක්‍රිස්තුස් වහන්සේ තුළින් නව බලාපොරොත්තුවක් ඇති බව විශ්වාස කරයි.<br>● සදාතන ජීවිතය පිළිබඳව එකමුතු ව දෙවියන් වහන්සේ පසසයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 03. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි. | 6.3.1 ජේසුස් වහන්සේගේ බව්තීස්මය තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි. | 6.3.1 **ජේසුස් වහන්සේගේ බව්තිස්මය** (ශු. මාක් 1:9-11) | • ජේසුස් වහන්සේගේ බෞතිස්මය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව පිළි ගනියි.<br>• අවබෝධයෙන් යුතුව ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• දේව හඬට සවන් දෙයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් සාමුහික ව දිවි ගෙවයි. | 2 |
| | 6.3.2 ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම තුළ ක්‍රියාකාරී වෙයි. | 6.3..2 **ජේසුස් වහන්සේ පාළුකරයට යොමු කිරීම.** (ශු. ලූක් 4 :1-12) | • ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවන් විස්තර කරයි.<br>• දේව වචනය තුළ විසඳුම් ඇති බව පිළි ගනියි.<br>• ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවන් පිළිබඳව පෝස්ටරයක් නිර්මාණ කරයි.<br>• දේව වචනය තුළින් පරීක්ෂාවන් වලින් මිදිය හැකි බව විශ්වාස කරයි.<br>• ශුද්ධාත්ම මග පෙන්වීම ලබමින් සමාජය තුළ ක්‍රියාකාරි නව ජීවිතයක් ගත කරයි | 3 |
| | 6.3.3 ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය තුළින් දිරියක් ලබයි. | 6.3.3 **පිලිප් ගාසාවට යන මාර්ගයට ගෙන යාම.** (ක්‍රියා 8:26-40) | • ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ලබා දෙන කැඳවීම විස්තර කරයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය පිළිගනියි.<br>• චිත්‍ර කතාවක් නිර්මාණය කරයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ දේව සේවයට අප ව කැඳවන බව විශ්වාස කරයි.<br>• අන් අයට සුභාරංචි ය ප්‍රකාශ කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 04. දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි. | 6.4.1 දේව රාජ්‍යය තුළ ප්‍රේමයේ ඇති විශිෂ්ටත්වය වටහා ගනියි. | 6.4.1 ප්‍රේමය (යහපත් සමාරිතයාගේ උපමාව.) (ශු.ලූක් 10: 25-37) | ● යහපත් සමාරිතයාගේ උපමාව තුළින් මතුවන ප්‍රේමය පිළිබඳ අදහස් පැහැදිලි කරයි.<br>● සැබෑ ප්‍රේමය දේව රාජ්‍යයේ වටිනා ගුණාංගයක් බව පිළි ගනියි.<br>● සැබෑ කිතුනු ප්‍රේමය පිළිබඳ ගීතිකාවක් නිර්මාණය කරයි.<br>● ප්‍රේමය තුළින් නිරතුරුවම අභියෝග ජය ගත හැකි බව විශ්වාස කරයි.<br>● පරාර්ථකාමී ලෙස සහය වීම තුළින් අන් අයට ප්‍රේම කරයි. | 3 |
| | 6.4.2 දේව රාජ්‍යයේ පුරවැසියකු ලෙස ඇදහිල්ලේ බලය අත්දකියි. | 6.4.2 ඇදහිල්ල (ජේරිකෝවේ අන්ධයාට සුවය). (ශු.මාක් 10:46-52) | ● අන්ධ මිනිසා සුවය ලැබීමේ සිදුවීම විස්තර කරයි.<br>● ඇදහිල්ලේ ජීවිතයක් ගත කළ යුතු බව පිළි ගනියි.<br>● ඇදහිල්ල වර්ධනය කරන ලෙස අයදින යැදුමක් රචනා කරයි.<br>● ඇදහිල්ල තුළින් ප්‍රාතිහාර්ය අත්දැකිය හැකි බව විශ්වාස කරයි.<br>● දේව ඇදහිල්ල අන් අය තුළ වර්ධනය කිරීමට ක්‍රියා කරයි. | 2 |
| | 6.4.3 දේව රාජ්‍යයේ පුරවැසියකු ලෙස සමාව දානය කරයි. | 6.4.3 සමාව දීම(නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාව) (ශු. ලූක් 15:11-32) | ● නැතිවූ පුත්‍රයාගේ උපමාව පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දෙවි පියාණන් වහන්සේ පසුතැවිලි වන අපට නිරතුරුව ම සමාව දානය කරන බව පිළි ගනියි.<br>● නැතිවූ පුත්‍රයාගේ උපමාව නිර්මාණාත්මක අයුරින් රඟ දක්වයි.<br>● සමාව දීම තුළින් ජීවිත ගොඩ නැගෙන බව විශ්වාස කරයි.<br>● කිතුනුවකු ලෙස එදිනෙදා ජීවිතයේදී අන් අයට සමාව දීමට යොමු වෙයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.4.4<br>නිරතුරුව ම දෙවියන් වහන්සේට තුති පිදීමට යොමු වෙයි. | 6.4.4<br>**ස්තුති දීම (ලාදුරු රෝගීන් දස දෙනාගේ කතාව)**<br>(ශු. ලූක් 17: 11-19) | • ලාදුරු රෝගීන් දස දෙනාගේ උපමාව විස්තර කරයි.<br>• නිරතුරුව ම දෙවියන් වහන්සේට තුති පිදිය යුතු බව පිළිගනියි.<br>• තුති පිදීමේ කාඩ් පතක් නිර්මාණය කරයි<br>• ස්තුතියි යන වදන එදිනෙදා ජීවිතය තුළ සැම විට ම භාවිත කරයි.<br>• අන් අය වෙතින් ලබන උපකාර සඳහා හද පත්ලෙන් ම තුති පුදයි. | 2 |
| | 6.4.5<br>නිහතමානි බව තම ජීවිතයට අත්පත් කර ගනියි. | 6.4.5 **නිහතමානිකම (පරිසියා සහ අයකැමියා පිළිබඳ උපමාව)**<br>(ශු. ලූක් 18: 9-14) | • යාච්ඤා කිරීමට ගිය පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාව සම්බන්ධ කරුණු ගොනු කරයි.<br>• නිහතමානීකම දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ලක්ෂණයක් බව පිළි ගනියි.<br>• නිර්මාණාත්මක පෝස්ටරයක් ඉදිරිපත් කරයි.<br>• නිහතමානීකම තුළින් යහපත් සමාජයක් ගොඩනැගිය හැකි බව විශ්වාස කරයි. | 2 |
| 05.<br>ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි. | 6.5.1<br>ශුද්ධ බයිබලයේ සැකැස්ම පැහැදිලි කර ගනියි. | 6.5.1 **ශුද්ධ බයිබලය සැකැස්ම හා වර්ගීකරණය** | • ශුද්ධ බයිබලය වර්ගීකරණය කරයි<br>• ශුද්ධ බයිබලයේ ඇති දෙව් වදන් පිළි ගනියි.<br>• ශුද්ධ බයිබලයේ වර්ගීකරණය පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරයි.<br>• ශුද්ධ බයිබලයේ ආදර්ශ හා උපදෙස් අනුගමනය කරයි.<br>• ශුද්ධ බයිබලයට අනුකූලව ජීවිතය ගත කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.5.2<br>ශුද්ධ බයිබලයේ විශිෂ්ටත්වය හඳුනා ගනියි. | 6.5.2<br>**කිතුනු දිවියට ජීවමාන මග පෙන්වීමක්** | ● ශුද්ධ බයිබලය නිවැරදිව කියවීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>● දේව වචනය කියවීමෙන් දේව මග පෙන්වීම ලැබෙන බව පිළි ගනියි.<br>● ශුද්ධ බයිබලයෙන් ලැබෙන උපදේශ පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරයි.<br>● දේව වචනය ජීවමාන බව විශ්වාස කරයි.<br>● ශුද්ධ බයිබලය තුළින් ලබා දෙන මග පෙන්වීම තුළ අන්‍යොන්‍ය සහයෝගයෙන් ජීවත් වෙයි. | 2 |
| | 6.5.3<br>දාවිත් තුළින් දිවියට සවියක් ලබයි. | 6.5.3 **දාවිත් - 1සාමුවෙල්17:37-40,45,47පද** | ● දාවිත් තුළ දෙවියන් වහන්සේ පිළිබඳ තිබුනා වූ විශ්වාසය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● අභියෝග ජය ගැනීමට දෙවියන් වහන්සේගෙන් අපට ශක්තිය ලැබෙන බව පිළිගනියි.<br>● දාවිත් තුළ දෙවියන් වහන්සේ පිළිබඳ ව තිබුණා වූ විශ්වාසය ප්‍රකාශ වන වැකි නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>● දෙවිඳුන්ගේ නාමයෙන් ජයගත හැකි බව විශ්වාස කරයි.<br>● තරාතිරම් නොබලා කටයුතු කරයි. | 3 |
| | 6.5.4<br>සහෝදර ප්‍රේමයෙන් කටයුතු කරයි. | 6.5.4 **මිරියම් - නික්මයාම 2: 5-9** | ● මීරියම් තුළ තිබුණා වූ යහපත් ගුණාංග විස්තර කරයි.<br>● නිරතුරුව දේව ආරක්ෂාව ලැබෙන බව පිළි ගනියි.<br>● මීරියම්ගේ චරිත කථාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>● අභියෝග හමුවේ උපක්‍රමශීලීව කටයුතු කරයි.<br>● සමාජය තුළ සහෝදරත්වයෙන් හා සහයෝගයෙන් ජීවත් වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.5.5<br>දේව හඬට සවන් දීමට හුරු වෙයි. | 6.5.5 සාමුවෙල් - 1 සාමුවෙල් 3: 1 - 10 | ● සාමුවෙල්ගේ කැඳවීමට අදාළ කරුණු ගොනු කරයි<br>● දෙවියන් වහන්සේගේ හඬට සවන් දිය යුතු බව පිළිගනියි.<br>● සාමුවෙල්ගේ කතාවට අදාල චිත්‍ර නිර්මාණය කරයි.<br>● දෙවියන් වහන්සේගේ හඬට කීකරු වෙයි.<br>● සාමූහික නමස්කාරයේ යෙදෙයි. | 3 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 6.1.1** : දෙවියන් වහන්සේ මනහර දේව නිර්මාණයේ මැවුම්කරුවාණෝ බව අත්දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- දින හය තුළ දෙවියන් වහන්සේ මවන ලද දේ පිළිබඳ ව තොරතුරු පිළිවෙළින් ගොනු කරයි
- දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව පිළි ගනියි.
- චිත්‍රයක් මගින් දේව මැවිල්ල ඉදිරිපත් කරයි
- මනහර මැවිල්ල ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි.
- සාමූහිකව දෙවියන් වහන්සේට තුති පුදමින් නමස්කාර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1
- සිසුන්ට පරිසරය නිදහසේ නැරඹිය හැකි ස්ථානයකට ගෙන යන්න.
- පරිසරය නිරික්ෂණය කිරීමට ඉඩ හරින්න.
- දරුවන්ගේ නිරීක්ෂණ ඇසුරින් සාකච්ඡාව මෙහෙය වන්න.
    - පරිසරයේ විවිධ ගස් වැල්, මල් වර්ග, සතුන් සිටින බව.
    - ආකාශ වස්තුන් හා මහ පොළොව විස්මය දනවන සුළු දේව නිර්මාණ බව
    - දෙවියන් වහන්සේ මැවූ ලෝකයේ විවිධත්වය හා විශිෂ්ඨත්වය ඇති බව.

(මිනිත්තු 15)

පියවර 2
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - අප ජීවත් වන ලෝකය දෙවියන් වහන්සේ මවා ඇති බව
    - මැවිල්ල ඉතා මනහර හා ශ්‍රේෂ්ඨ බව
    - දින හයකින් දෙවියන් වහන්සේ ලෝකය මවා වදාළ බව.
    - සත් වන දිනය ශුද්ධ ලෙස ගත කිරීමේ දිනය බව
    - මැවිල්ලේ මනහර බව පිළිබඳ ව නිරතුරුව ම තුති පිදිය යුතු බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - උත්පත්ති 1: 1-31, 2: 1-3
පාට පැන්සල්, දියසායම් වර්ග
ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.
- එම පාඨයෙන් මතුවන කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**1 කණ්ඩායම** - දින හය තුළ මවන ලද දේ **චිත්‍රයට** නගන්න.

**2 කණ්ඩායම** - දේව මැවිල්ල තුළ ඇති පහත සඳහන් දේ **වගු ගත** කරන්න.

- ආකාශ වස්තූන්
- විවිධ සතුන්
- විවිධ මල්
- විවිධ පලතුරු
- විවිධ එළවළු

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

කුණු කසල හා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට යොමු කරවන්න

**නිපුණතාව 1.0 :** දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 6.1.2 :** දෙවියන් වහන්සේ විවිධ අගනා දේව නිර්මාණ සපයා දුන් බව අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- මැවිල්ල තුළින් දෙවියන් වහන්සේ සපයා දී ඇති ආකාශ වස්තූන් හා සත්ත්ව ලෝකය වගු ගත කරයි.
- ගස්වැල් හී වර්ධනය දෙවියන් වහන්සේගේ ක්‍රියාවලියක් බව පිළිගනියි.
- අවබෝධයෙන් යුතු ව ප්‍රශ්න වලට පිළිතුරු සපයයි.
- මැවිල්ල තුළින් දේව මහිමය ප්‍රකාශ වන බව විශ්වාස කරයි.
- දෙවියන් වහන්සේ ලබා දුන් අගනා දේව නිර්මාණ පිළිබඳව එක්ව තුති පුදයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 ලබා දී එහි ඇතුළත් ගීතය ගායනා කිරීමට සියලුම සිසුන් යොමු කරන්න.
- ගීතිකාවේ සඳහන් වන දේව මැවිල්ල පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ගනඳුරු දුරු කරන හිරු සහ සඳු දෙවියන් වහන්සේ මවා ඇති බව.
  - සාගර, ගංගා, දියඇළි, අගනා දේව නිර්මාණ බව.
  - විවිධ සතුන් දෙවියන් වහන්සේ නිර්මාණය කර ඇති බව.
  - ගී ගයන කුරුල්ලන් දේව මැවිල්ලේ අගනා දීමනාවක් බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙහි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - සියලුම ආකාශ වස්තූන් දෙවියන් වහන්සේ මවා ඇති බව
  - දෙවියන් වහන්සේ ගස්වැල් වර්ධනය වීමට සලසන බව.
  - මැවිල්ලේ සෑම අංගයක් ම ඵලදායී හා අරමුණු සහිත බව.
  - සත්ත්ව ලෝකය තුළින් මිනිසා විවිධ දේ අත්පත් කරගන්නා බව. (ආදර්ශය, සතුට, ආදරය).

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - උත්පත්ති 1: 6-25
ඇමුණුම 1
ඇමුණුම 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

- **උත්පත්ති 1: 6-25,** ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.

**1 කණ්ඩායම** - කියවන ලද බයිබල් කොටසට අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. අපට ආලෝකය දීමට දෙවියන් වහන්සේ මවා ඇති ආකාශ වස්තූන් මොනවාද?
2. ආකාශ වස්තූන් ඉටු කරන කාර්යයන් මොනවාද?
3. බීජ උපදවන ඇට සහිත ගස් නිර්මාණය කළේ කිනම් දිනයේද?
4. සත්ත්ව ලෝකය නිර්මාණය කර පක්ෂීන්ට දෙවියන් වහන්සේ පැවසුවේ කුමක්ද?
5. මැවිල්ලට පසුව සෑම දිනකම දෙවියන් වහන්සේ තම මැවිල්ල ගැන දුටුවේ කුමක්ද?

**2 කණ්ඩායම** - මැවිල්ල තුළ දෙවියන් වහන්සේ මිනිසාට ලබා දී ඇති අගනා ආකාශ වස්තූන් හා සත්ත්ව ලෝකයේ විවිධ සතුන් ද එමගින් මිනිසා ලබන ප්‍රයෝජන ද  වගු ගත කරන් න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

(ක්‍රිස්තියානි ගීතිකා පොතේ 38 ගීතිකාව)

1. දෙව් තුම මැව් මුළු ලෝ බඳුරු
වේ රුසිරු බෝ අයුරු
දෙම් එතුමන් හට මේ මහරු
ගී මියුරු මල් පොකුරු

2. අහස බලා යන කඳු සොඳුරු
ගිරි කඳුරු වන දැදුරු
නිල් වන පෙත සැදි ලතා තුරු
බිම් නිසරු කතර මරු

3. සිහ දිවි වග වලසුන් කුරිරු
දෙන අබිරු නද රුදුරු
සමග අහිංසක මුව කෙණෙරු
මැවුම්කරු අන් කවුරු

4. අතු අග හිඳ රැව් දෙන මියුරු
රැස කුරුළු නයන කළු
දෙත් පැසසුම් නැතිව ම අතුරු
ඔබ උතුගු නමට ගරු

5. දිය ගොඩ වෙන් කර මැවූ සොඳුරු
පොළෝ සරු මහ සයුරු
අසිරි ද කෙතරම් ඔබ නිමැවූ
මේ සියලු මැවුම තුගු

6. ගං හෝ විල් ඇල දොළ පොකුණු
වැව් අමුණු දිය පිරුණු
කෙත් වතු කොටු තණ බිම් නිසරු
කරන සරු නිල් වතුරු

7. අහසෙහි බබලන සඳුද හිරු
සණ අඳුරු කරන දුරු
රැය ද දවාල ද මැවූ අයුරු
වැණුමැ සුරු වෙති කවුරු

8. වැනුමට මා බස වේ දිළිඳු
ඔබ උතුගු ගුණ මහරු
ඔබ සිරි නම මා සවන පිරූ
වේ මියුරු දිව මතුරු

**ගෙදර පරිසරයෙන්**

සතුන් ආදරයෙන් රැකබලා ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 6.1.3 :** දේව මැවිල්ල පිළිබඳ ව තුති පුදමින් එහි සංරක්ෂක භාරකරුවන් ලෙස ක්‍රියා කිරීමට පෙළඹෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- මිනිසා දේව නිර්මාණයේ මුදුන් මල්කඩ බවට තොරතුරු ගොනු කරයි.
- දේව මැවිල්ල සංරක්ෂණය කිරීම අවශ්‍ය බව පිළිගනියි.
- නිර්මාණාත්මක පෝස්ටර් මගින් මැවිල්ල පිළිබඳව තම වගකීම් ඉදිරිපත් කරයි.
- දෙවියන් වහන්සේ දුන් තම ජීවිතය ලොව තුළ සුරක්ෂිත කර ගත යුතු බව විශ්වාස කරයි.
- පරිසරය සුරැකීමට සාමූහික ව කැප වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- නිශ්චලව නෙත් පියාගෙන තමා තුළ තිබෙන වටිනා ගුණාංග 3 ක් මෙනෙහි කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ට A 4 කඩදාසි ලබා දී එහි තමා මෙනෙහි කළ ගුණාංග ලිවීමට සලස්වන්න
- සිසුන්ට මහපට ඇඟිල්ලේ තවරා ගැනීමට තීන්ත ලබා දී තම ඇඟිලි සලකුණ A4 කඩදාසියේ මුද්‍රණය කිරීමට අවස්ථාව ලබා දෙන්න
- එම A 4 කඩදාසිය තමා ළඟම සිටින සිසුවා සමඟ හුවමාරු කර ගැනීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් සාකච්ඡාවකට අවතීර්ණ වන්න.
    - මිනිසා දෙවියන් වහන්සේ ගේ අගනා නිර්මාණයක් බව
    - අප එකිනෙකා හට පොදු ගුණාංග තිබෙන බව
    - අප එකිනෙකාට විවිධ ලක්ෂණ හා වටිනාකම් තිබෙන බව

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- මිනිසා දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් බව
- සියලුම වෘත්තීමය හැකියාවන් දෙවියන් වහන්සේගේ තිළිණ බව.
- සත්ත්ව විශේෂයන් රැක ගැනීම මිනිස් වගකීම බව.
- දෙවියන් වහන්සේ දී ඇති හැකියාවන් වර්ධනය කර ගත යුතු බව.
- දරුවන්ගේ ජීවිත සමාජයේ දී සුරක්ෂිත කළ යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - උත්පත්ති 1:27-28, 2 : 15, ගීතාවලිය 19 : 1-2
දරුවන් සමාජයේ සුරක්ෂිත කිරීම පිළිබඳ ව පුවත් ප්‍රකාශනයක්
සතුන් ආරක්ෂා කිරීම හා වඳ වී යන සතුන් පිළිබඳ ව පුවත් ලිපි
ස්වභාවික ව්‍යසන පිළිබඳ ව පින්තූර කිහිපයක්
ඇඟිලි සලකුණු මුද්‍රණයට සුදුසු තීන්ත, වතුර භාජනයක්
විවිධ වෘත්තීන් පිළිබඳ ව පින්තූර,
A4 කඩදාසි , කතුරු, පැස්ටල්, පාට පැන්සල්
ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

- ඔබට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨ හොඳින් කියවන්න. - **උත්පත්ති 1:27-28, 2:15, ගීතාවලිය 19:1-2**

- ලබා දී ඇති පින්තූර, චිත්‍ර, පුවත්පත් ලිපි අවධානයෙන් යුතුව අධ්‍යයනය කරන්න.

**1 කණ්ඩායම** - තමන්ට ලැබී ඇති 'විවිධ ජීවන වෘත්තීන්' පිළිබඳ චිත්‍ර, ඡායාරූප ඇසුරින් විවිධ වෘත්තීන් මගින් සමාජයට සිදු කරන සේවාවන් ලැයිස්තු ගත කරන්න.

**2 කණ්ඩායම** -තමන්ට ලැබී ඇති සතුන් ආරක්ෂා කිරීමේ පුවත් ලිපි ඇසුරින් 'දේව මැවිල්ල තුළ සත්ත්ව ලෝකයේ වඳ වී යන සතුන් රැක ගැනීම' පිළිබඳ ව ලිපියක් සකස් කරන්න.

**3 කණ්ඩායම** -තමන්ට ලැබී ඇති 'සමාජය තුළ දරුවන් සුරක්ෂිත කිරීම' පිළිබඳ ව පුවත් ප්‍රකාශන ඇසුරින්, 'දරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ වැදගත්කම' දැක්වෙන ආදර්ශ පාඨ නිර්මාණය කරන්න.

**4 කණ්ඩායම** - සපයා දී ඇති ස්වභාවික ව්‍යසන පිළිබඳ චිත්‍ර, ඡායාරූප ඇසුරෙන් දේව නිර්මාණය සංරකෂණය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව පුවත් පතකට ලිපියක් රචනා කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම විටම ආරක්ෂාකාරී ලෙස දිවි ගෙවීමට යොමු කර වන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.1 :** ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂී බව වටහා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් පල**

- ජේසු උපත පිළිබඳ තොරතුරු ගොනු කරයි
- ජේසුස් වහන්සේ ගැළවුම්කරුවාණන් බව පිළිගනියි
- ජේසු උපත නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි
- නිහතමානී ව දේව හඬට කීකරු වෙයි.
- සාමූහික ව දෙවියන් වහන්සේට තුති පුදමින් නමස්කාර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ගෙනෙන ලද ජේසු උපත දැක්වෙන පින්තූරය දරුවන්ට ඉදිරිපත් කරන්න.
- එම පින්තූරය ආශ්‍රයෙන් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ ගවලෙනක උපත ලද බව
    - ජේසුස් වහන්සේ බැහැ දැකීමට මුලින් ම එඬේරුන් පැමිණි බව
    - ශාස්ත්‍රවන්තයන් විශේෂ තෑගි ජේසුස් වහන්සේට ඔප්පු කළ බව.

(මිනිත්තු 25)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 85)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ගාබ්‍රියෙල් දේව දූතයා ජේසු උපත පිළිබඳ ව මරියතුමියට දැනුම් දීම. ශු. ලූක් 1:26-31
    - මරියතුමිය හා ජෝසෙප්තුමා බෙත්ලෙහෙමට යාම. ශු. ලූක් 2 : 1-5
    - බෙත්ලෙහෙමේ ගවමඩුවක ජේසු උපත සිදුවීම. ශු. ලූක් 2 : 6-7
    - එඬේරුන්ට ජේසු උපත දැනුම්දීම. ශු. ලූක් 2:8-14
    - එඬේරුන්ගේ ප්‍රතිචාරය ශු. ලූක් 2 :15-20
    - ශාස්ත්‍රවන්තයින්ගේ පැමිණීම ශු. මතෙව් 2 : 1-12
    - ජේසු උපත තුළින් අද සමාජයට ලැබෙන පණිවුඩය.

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** :ශුද්ධ බයිබලය - ශු. ලූක් 1:26-31, 2:1-7, 2:8-20, ශු. මතෙව් 2:1-12
ජේසු උපත දැක්වෙන පින්තූරය- (බැටළු එඬේරු, ශාස්ත්‍රවන්තයන් හා දේවදූතයන් සහිත)
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨයන් හොඳින් කියවන්න.

  **ශු. ලූක් 1:26-31, 2:1-7, 2:8-20, ශු. මතෙව් 2:1-12**

- කියවන ලද ශුද්ධ ලියවිලි පාඨ මෙනෙහි කරන්න.
- ජේසු උපත පිළිබඳ **නාට්‍ය පිටපතක්** රචනා කරන්න.
- රචනා කරන ලද නාට්‍ය පිටපත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නත්තලේ ප්‍රීතිය අවශ්‍යතා ඇති අය සමග බෙදා ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.2** :ජේසුස් වහන්සේගේ ළමා කාලය තම ජීවිතයට ආදර්ශයක් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ අවුරුදු 12 දී පාස්කු මංගල්‍යය සැමරීම පිළිබඳ විස්තර කරයි.
- ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගේ ප්‍රසාදය දිනා ගනිමින් කටයුතු කළ බව පිළිගනියි.
- නිර්මාණාත්මක ව සඟරාවකට ලිපියක් රචනා කර ඉදිරිපත් කරයි
- ජේසුස් වහන්සේ මෙන් දේව සබඳතාවයෙන් යුතුව ජීවත් වෙයි.
- කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- අවරුදු 12 දී ජේසුස් වහන්සේ දේව මාලිගාවේ රැඳී සිටින පින්තූරය දරුවන්ට ඉදිරිපත් කරන්න.
- එම පින්තූරය ආශ්‍රයෙන් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ පඬිවරුන් සමග සාකච්ඡා කළ බව
    - ජෙරුසලම් දේව මාලිගාවේ මෙම සිදුවීම සිදු වූ බව.
    - මෙම සිදුවීම වන විට ජේසුස් වහන්සේගේ වයස අවරුදු 12ක් වූ බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සැම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පල කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න
    - ජේසුස් වහන්සේගේ දෙමව්පියන් ජුදෙව් සිරිත්වලට ගරු කළ බව.
    - ජේසුස් වහන්සේ කුඩා කළ සිට ම දෙවියන් වහන්සේ සමඟ ඉතා කිට්ටු සබඳතාවයෙන් යුතු ව ක්‍රියා කළ බව.
    - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ හා මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් හැදී වැඩුණු බව.
    - ජේසුස් වහන්සේ මෙන් අප ද දෙවියන් වහන්සේ සමග සබඳතාවයෙන් යුතු ව ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ලූක් 2 : 39 - 40, 2 : 41 - 52
ජේසුස්වහන්සේ වයස අවුරුදු 12 දී දේව මාලිගාවේ රැඳී සිටින පින්තූරයක්.
A4 කඩදාසි
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**1 කණ්ඩායම:** **ශු. ලූක් 2: 39-52** කියවා පහත මාතෘකාවට අදාළ ව පුවත්පතකට ලිපියක් සකසන්න.

**'ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ කරුණාව හා මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් හැදී වැඩුණු සේක.'**

**2 කණ්ඩායම:** **ශු. ලූක් 2: 39-52** කියවා පහත මාතෘකාවට අදාළ ව සඟරාවකට ලිපියක් සකසන්න.

**'ජේසුස් වහන්සේ මෙන් අප ද දේව සබඳතාවයෙන් යුතු ව ජීවත් වෙමු.'**

**3 කණ්ඩායම:** **ශු. ලූක් 2: 39-52** කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේට වයස අවුරුදු 12 දී දෙමාපියන්, උන්වහන්සේ වෙනුවෙන් ඉටු කළ ජුදෙව් චාරිත්‍රය නම් කරන්න.
2. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ කරුණාව ලද බව අඟවන බයිබල් පාඨය ලියන්න.
3. මංගල්‍යය අවසන් වූ පසු ජේසුස් වහන්සේ ක්‍රියා කළේ කෙසේද?
4. උන්වහන්සේ සොයා පැමිණි මව්පියන්ට උන්වහන්සේ දුන් පිළිතුර කුමක්ද?
5. එදිනෙදා ජීවිතයේදී දේව සබඳතාවයෙන් යුතුව ක්‍රියා කිරීමට ගත හැකි පියවර විස්තර කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම ඉරුදිනක ම දහම් පාසල් යැමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.3** :ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා කුරුසිපත් වීම පිළිබඳ සිදුවීම් අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට පෙර සිදුවීම් පෙළ ගස්වයි.
- අපගේ පාපය උදෙසා ජේසුස් වහන්සේ තම දිවි පුද කළ බව පිළි ගනියි.
- බිත්ති පුවත් පතකට නිර්මාණාත්මක ලිපි පෙළක් ඉදිරිපත් කරයි.
- ජේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් ගැළවීම ලද බව විශ්වාස කරයි.
- දෙවියන් වහන්සේට තුති පුදමින් දිවි ගෙවයි..

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2: 3:2 සිසුන් අතට පත් කර ගීතිකාව ගායනා කරන්න.
- එම ගීතිකාව ගායනා කරන විට ඇති වූ හැඟීම් පිළිබඳ ව විමසීමක් කරන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ කල්වරි කන්දේ කුරුසිය මත තම ජීවිතය පූජා කළ බව.
    - නායක පූජකයන්, විනයධරයන්, පරිසිවරුන්, සද්දුසිවරුන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද උන්වහන්සේ කුරුසිපත් කිරීමට දායක වූ බව.
    - උන්වහන්සේගේ ජීවිත පූජාවෙන් අපගේ පාපයට සමාව ලද බව.
    - උන්වහන්සේ අප නිසා බොහෝ දුක් වේදනාවට පත් වූ බව.

(මිනිත්තු 25)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 85)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - කිරේනියේ සීමොන් කුරුසිය උසුලා ගෙන යාමට ජේසුස් වහන්සේට උපකාර කළ බව. ශු. මතෙව් 27 : 32
    - ජේසුස් වහන්සේ බොහෝ නින්දා පීඩා විඳි බව. ශු. මතෙව් 27 : 32 - 50
    - ජේසුස් වහන්සේ කුරුසියේ දී කළ ප්‍රකාශ පවා අපහාසයට ලක්වූ බව.
    - ජේසුස් වහන්සේ සියල්ල විඳ දරා ගනිමින් අපගේ පාපය උදෙසා දිවි පුද කළ බව.
    - ජේසුස් වහන්සේට සේවය කිරීමේ දී පැමිණෙන දුක් වේදනා ඉදිරියේ නොසැලී ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. මතෙව් 27 : 32 - 50
A4 කඩදාසි, පෑන්, පැන්සල්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**1 කණ්ඩායම:** **ශු. මතෙව් 27: 32 – 50** දක්වා බයිබල් කොටස කියවන්න.

පහත මාතෘකාවට අදාළ ව චිත්‍රයක් නිර්මාණය කරන්න.

**'කිරේනියේ සීමොන් ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූ අයුරු'**

**2 කණ්ඩායම:** **ශු. මතෙව් 27 : 32 – 50** දක්වා බයිබල් කොටස කියවන්න.
පහත මාතෘකාවට අදාළ ව බිත්ති පුවත් පතකට ලිපියක් සකසන්න.

**'ජේසුස් වහන්සේ කුරුසියේ දී කළ ප්‍රකාශ හා ඊට ජනතාව දැක් වූ ප්‍රතිචාර'**

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

.

**ඇමුණුම 2**

ඒ ලේ ගැලුවේ. . . . මා නිසයි
ඒ කය බිඳුනේ . . . . මා නිසයි
දෙව් පුත් මැරුණේ මා නිසයි
අද මා මිදුණේ ජේසුස් නිසයි

කුරුසියේ නැඟුණා
දෙව් පුත් මැරුණා
යාගය පිදුණා
පිළිගන්නේ නම් මෙමා
ලබනෙමි ජීවය අමා //

**ගෙදර පරිසරයෙන්**

තමා අතින් වරදක් වූ විට කමාව ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.4** :ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් ආලෝකය ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ නැවත නැගිටීමට අදාළ සිද්ධීන් පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ තෙදිනකින් නැවත නැගිටි බව පිළිගනියි.
- ජේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ සිදුවීම නිර්මාණාත්මක දෙබසක් ලෙස ඉදිරිපත් කරයි.
- උන්වහන්සේගේ නැවත නැගිටීම තුළ අපට නව බලාපොරොත්තුවක් ඇති බව විශ්වාසයෙන් කථා කරයි.
- උත්ථානයේ පණිවුඩය අන් අයට ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සැම දරුවෙකුට ම මල බැගින් දෙන්න.
- මැටි පහනක් දල්වා දරුවන් රැස් කොට ඇමුණුම 2 ඉදිරිපත් කරමින් භාවනාවකට මග පෙන්වන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ අප උදෙසා කුරුසිපත් වූ ආකාරය
    - තෙ දිනකින් උන්වහන්සේ මරණයෙන් උත්ථාන වූ බව.
    - උන්වහන්සේගේ නැවත නැගිටීම තුළින් අපට නව බලාපොරොත්තුවක් ඇති වූ බව.
    - දැල්වූ පහන් මෙන් අප ජීවිත තුළින් අන් අයට ආලෝකයක් විය යුතු බව.

.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සැම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40

)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- සතියේ පළමුවන දා උන්වහන්සේ නැවත නැගිටි බව - ශු. ලූක් 24 : 1
- උන්වහන්සේ බැලීමට ගිය අය හිස් වූ සොහොන දුටු බව.
- දේව දූත මග පෙන්වීම අනුව ඔවුන් ක්‍රියා කරමින් සුභාරංචිය අන් අයට ප්‍රකාශ කළ බව.
- ජේසුස් වහන්සේගේ නැවත නැගිටීම මහත් ප්‍රීතියෙන් අත් දුටු බව.
- උන්වහන්සේගේ උත්ථානය අත් දුටු අය මෙන් අප ද සාක්ෂි දැරිය යුතු බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** :ශුද්ධ බයිබලය - ශු. මතෙව් 28 : 1 - 10
මල්, මැටි පහන්, තෙල්, තිර, ගිනිපෙට්ටිය
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. මතෙව් 28:1-10** බයිබල් කොටස කියවා මෙනෙහි කරන්න.

**'මග්දලායේ මරියා හා අනෙක් මරියා සොහොන් ගෙය බැලීමට ගිය විට වූ සිදුවීම'**
දෙබසක් ලෙස නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

යාච්ඤාවෙන් යුතුව නිසඳැස ඉදිරිපත් කරන්න.

දයාබර දෙවිඳුනි,
ඔබතුමාගේ කරුණාව හේතුවෙන්,
අප ලද ගැළවීම පිළිබඳව,
තුති පුදමු හද බැතින්.

අපගේ පව් බර කරට ගෙන,
කුරුසි පත් ඔබතුමා,
තෙ දිනකින් මරු පරදා,
උත්ථානවූ,
ඒ ජයග්‍රාහි මොහොත,
ගැළවීමේ සුපුවත,
සිහි කරමු බැතින් සදා.

අප ජීවිත අළුත් වී,
අන් අයට ආලෝක වී,
ගෙන යන්නට සුපුවත,
මග සදන් සමිඳුනි . . . . සැමදා.

**ගෙදර පරිසරයෙන්**

අසහනයෙන් පෙළෙන මිතුරකුට සහනයක් වීමට යොමු කරවන්න.

**නිපුණතාව 2.0 :** ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.5 :** ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ සිද්ධීන් පෙළ ගස්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ උත්ථානය වූ බවට සාක්ෂි ගොනු කරයි.
- ජේසුස් වහන්සේ උත්ථානය වූ බව පිළිගනියි.
- ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ සාක්ෂි දැරූවන්ගේ අදහස් නිර්මාණාත්මක පෝස්ටරයක් තුළින් ඉදිරිපත් කරයි.
- ජේසුස් වහන්සේ නැවත නැගිටි බව විශ්වාස කරයි.
- උන්වහන්සේගේ උත්ථානය පිළිබඳව සාක්ෂි දරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- කිතුනුවන් ගේ පාස්කුව පිළිබඳ ව විමසමින් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - කිතුනු පාස්කුවේ දී ජේසුස් වහන්සේ නැවත නැගිටීම සිහි කරන බව.
    - ජේසුස් වහන්සේ මරණය පරාජය කර ජය ගත් දිනය බව.
    - එදින කිතුනුවන්ගේ බලාපොරොත්තුව ඉටු වූ ජයග්‍රාහී දිනයක් බව.

(මිනිත්තු 30)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 80 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේගේ උත්ථානයට කාන්තාවන් සාක්ෂි දැරූ බව. ශු. ලූක් 24:1-11
    - පේදුරු තුමා සොහොන් ගෙය පරීක්ෂා කිරීමට පැමිණි බව. ශු. ලූක් 24:12
    - එම්මාවුස් ගමට ගිය ගෝලයින්ට උන්වහන්සේ දර්ශනය වීම. ශු. ලූක් 24:13 - 35
    - ජේසුස් වහන්සේ එක් අවස්ථාවක දී ගෝලයින් 11 දෙනා ඉදිරියේ ප්‍රකාශ වීම. ශු. ලූක් 24: 36 - 40
    - අප ද උන්වහන්සේ ගේ උත්ථානයට සාක්ෂි දැරිය යුතු බව.

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** :ශුද්ධ බයිබලය - ශු. ලූක් 24 : 1 - 40
බ්‍රිස්ටල් බෝඩ්
A4 කඩදාසි, පැන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**1 කණ්ඩායම**

**ශු. ලූක් 24 : 1-12** බයිබල් කොටස හොඳින් අධ්‍යයනය කරන්න

ජේසුස් වහන්සේ නැවත නැගිටි බවට ලද සාක්ෂි ගොනු කරමින් නිර්මාණාත්මක පෝස්ටරයක් සකස් කරන්න.

**2 කණ්ඩායම**

**ශු. ලූක් 24 : 13-35** බයිබල් කොටස හොඳින් අධ්‍යයනය කරන්න

එම්මාවුස් ගමට ගිය ගමනේ ඔබ එක් ගෝලයෙක් යැයි සිතා එදා සිදුවීම ගැන තම මිතුරෙකුට විස්තරාත්මක ලිපියක් ඉදිරිපත් කරන්න

**3 කණ්ඩායම**

**ශු. ලූක් 24 : 36-40** බයිබල් කොටස හොඳින් අධ්‍යයනය කරන්න

ගෝලයින් 11 දෙනාට ජේසුස් වහන්සේ ප්‍රකාශ වූ අයුරු දෙබසක් මගින් ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සෑම ඉරුදිනක ම දේව මෙහෙයට සහභාගී වීමට යොමු කර වන්න.

**නිපුණතාව 2.0 :** ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.6 :** ජේසුස් වහන්සේගේ පුනරුප්පීවනයේ ජයග්‍රහණය තම ජීවිතයට අත් පත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය, සදාතන ජීවනයට මග බවට කරුණු ගොනු කරයි.
- දේව සබඳතාවයට ඇතුලත් වීම තුළින් සදාතන ජීවිතය හිමිකරගත හැකි බව පිළිගනියි.
- නිර්මාණාත්මක ලිපි, නිසඳැස්, කවි ඉදිරිපත් කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ තුළින් නව බලාපොරොත්තුවක් ඇති බව විශ්වාස කරයි.
- සදාතන ජීවිතය පිළිබඳව එකමුතු ව දෙවියන් වහන්සේ පසසයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 ලබා දී ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ස්වාමින් වහන්සේට අපගේ ජීවිත භාර කළ යුතු බව.
    - අපගේ පාපී බවට කමාව අයදිය යුතු බව.
    - කිතුනුවන් ජේසුස් වහන්සේගේ මග ගමන් කළ යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. ඇමුණුම 1
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න..
    - ජේසුස් වහන්සේගේ ජීවිත පූජාවෙන් අපට සදාතන ජීවනය හිමිවන බව.
    - අපට සදාතන ජීවනය හිමි වන්නේ උන්වහන්සේ තුළින් පමණක් බව.
    - කිතුනුවන්ට ඇති විශේෂිතම බලාපොරොත්තුව සදාතන ජීවනය හිමි කර ගැනීම බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : බ්‍රිස්ටල් බෝඩ්,
A4 කඩදාසි, පෑන් වර්ග
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

පහත සඳහන් මාතෘකා අතරින් කැමති මාතෘකාවක් තෝරා ගන්න.

- **"ජේසුස් වහන්සේ නිසා මට හිමි වන සදාතන ජීවනය"**
- **"ක්‍රිස්තුස් වහන්සේ තුළ නව බලාපොරොත්තුව"**
- **"සදාතන දිවිය හිමිකර ගැනීමට මා කළ යුතු දේ"**

ඔබ තෝරා ගත් මාතෘකාවට අනුව සඟරාවකට සුදුසු පරිදි ලිපියක් /නිසඳැසක් /කවි පංතියක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

ස්වාමිනි දණින් වැටී ඔබේ පාමුලේ
මම් භාර වෙම් ඔබේ දෑතෙහි
පව්කාර මා වෙතේ නොහිම් පා දයා
සෝදා ඔබේ ලෙයින් මුදාලනු මැනේ

පාපී දණන් දුකින් මුදාලන ලෙසින්
පූජා කෙළේ ඔබේ ජීවිතේ
සී කොට පහන් සිතින් ගත් ඒ රොටි
දේ මහට අමරණීය ඒ ජීවනේ

ඒ සෝකුරු දිනේ කන්දේ ගොල්ගොතා
පව් බර දරා දණන් ලෝ සියල්
ඒ වගුල ලේ උතුම් සිහි ගන්වමින්
බොත් මේ බඳුන් පවිත්‍ර වේ දිවි මගේ

ලී කුරුසියක් මත මහත් දුක් දරා
ලොව්තුරු ඔබේ පිදූ ජීවිතේ
ගන්වයි බැතින් සිහි සදා මේ ලෙසේ
පූජාව නම් මෙයයි ඉතාමත් උතුම්

දුන් මහට මේ උතුම් සදා ජීවනේ
පූජාව ඒ ඔබේ මා හැඟී
ගත් මම් ඔබේ දෙපා තබා මා සිරස්
දෙම් තුති මහත් බැතින් සිතින් පුණ්‍ය වූ

(ක්‍රිස්තියානි ගීතිකා පොතේ 521)

**ගෙදර පරිසරයෙන්**

නිවසින් බැහැර වන විට ස්වාමින් වහන්සේට ජීවිත භාර කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 6. 3.1** :ජේසුස් වහන්සේගේ බෞතීස්මය තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ බෞතිස්මය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව පිළි ගනියි.
- අවබෝධයෙන් යුතුව ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- දේව හඬට සවන් දෙයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් සාමූහික ව දිවි ගෙවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ජේසුස් වහන්සේගේ බෞතීස්මය දැක්වෙන පින්තූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- සිසුන් දුටු දේ ඇසුරෙන් සාකච්ඡාව මෙහෙය වන්න.
    - ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබූ බව.
    - ස්නාවක ජොහාන් තුමා ජලයෙන් බෞතීස්ම කළ බව.
    - ජොර්දාන් නදිය අසල බෞතීස්ම කළ බව.

(මිනිත්තු 15)

පියවර 2

- ශු. මාක් 1: 9 - 11 බයිබල් කොටස පන්තියට ඉදිරිපත් කරන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මඟ පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න .
    - ස්නාවක ජොහාන් තුමා ජොර්දාන් ගඟ අසල බෞතිස්මය ස්නාපනය කළ බව.
    - ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමාගෙන් බෞතීස්ම ස්නාපනය ලැබූ බව. ශු. මාක් 1: 9
    - ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියකුගේ රූපාකාරයෙන් වැඩම කළ බව ශු. මාක් 1: 10
    - දෙවියන් වහන්සේගේ හඬ ඇසුණ බව. ශු. මාක් 1: 11
    - ශුද්ධ ත්‍රිත්වයේ වැඩ සිරීම.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. මාක් 1 : 9 - 11
ජේසුස් වහන්සේගේ බෞතිස්මය දැක්වෙන පින්තූරයක්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

**ශු. මාර්ක් 1: 9 -11** බයිබල් කොටස කියවා එය මෙනෙහි කරන්න.
ඒ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. .

i) ජේසුස් වහන්සේ බෞතීස්මය ස්නාපනය ලැබුවේ කවුරුන් අතින්ද ?
ii) ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබුවේ කුමන ස්ථානයකදී ද?
iii) එම අවස්ථාවේ සිදුවූ විශේෂ සිදුවීම කුමක්ද?
iv) බෞතීස්මය ලැබීමෙන් පසු අහසින් ඇසුනු වදන් මොනවාද?
v) ජේසුස් වහන්සේගේ බෞතීස්මය තුළින් ඔබ ඉගෙන ගත් දේ පිළිබඳව මිතුරෙකුට ලිපියක් ලියන්න.

එම පිළිතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නිරතුරුව ම ශුද්ධාත්ම මගපෙන්වීම සෙවීමට යොමු කරවන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 6.3.2 :** ශුද්ධාත්ම මඟපෙන්වීම තුළ ක්‍රියාකාරි වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ මුහුණදුන් පරීක්ෂාවන් විස්තර කරයි.
- දේව වචනය තුළ විසඳුම් ඇති බව පිළිගනියි.
- ජේසුස් වහන්සේ මුහුණදුන් පරීක්ෂාවන් පිළිබඳව පෝස්ටරයක් නිර්මාණය කරයි.
- දේව වචනයෙන් පරීක්ෂාවන් වලින් මිදිය හැකි බව විශ්වාස කරයි.
- ශුද්ධාත්ම මග පෙන්වීම ලබමින් සමාජය තුළ ක්‍රියාකාරි නව ජීවිතයක් ගත කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන්ට, තමන් මුහුණ දුන් පරීක්ෂාවක් බැගින් A 4 කඩදාසියක ලියා පන්තියේ ඉදිරිපත් කිරීමට සලස්වන්න
- ඒ ඇසුරෙන් සිසුන් සමඟ සාකච්ඡාවකට පිවිසෙන්න. පහත කරුණු ඉස්මතු කරන්න.
    - ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් සිටි බව.
    - යක්ෂයා ජේසුස් වහන්සේ පරීක්ෂා කළ බව.
    - ජේසුස් වහන්සේ දේව වචනයෙන් යක්ෂයා ට පිළිතුරු දුන් බව.
    - අප ද පරීක්ෂාවට හසුවන බව.
    - ශුද්ධාත්ම මඟපෙන්වීමෙන් ජය ගත යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න .
    - ශුද්ධාත්මයාණන් වහන්සේ ජේසුස් වහන්සේ පාළුකරයට ගෙන ගිය බව. ශු. ලූක් 4 : 1
    - ජේසුස් වහන්සේ පරීක්ෂාවන් ට මුහුණ දුන් බව. ශු. ලූක් 4 : 2 -13
    - ජේසුස් වහන්සේ දේව වචනය තුළින් පරීක්ෂාවලින් ජය ගත් බව.
    - අප ද පරීක්ෂාවන්ට හසුවන බව.
    - දේව වචනය තුළ පරීක්ෂාවන්ගෙන් ජය ගැනීමට අප ක්‍රියා කළ යුතු බව.
    - නිරතුරුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම සෙවිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය- ලූක් 4 : 1 - 12
A4 කඩදාසි / පෑන් /පැන්සල්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

.

**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. ලූක් 4 : 1 -13 බයිබල් පාඨය මනාව අධ්‍යනය කරන්න.**

ඒ ඇසුරින්

- ජේසුස් වහන්සේට පැමිණි පරීක්‍ෂාවන් හා දේව වචනය තුළින් එය ජය ගත් අයුරු දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න.

- ජේසුස් වහන්සේට පැමිණි පරික්ෂා හා ඊට ලබා දුන් පිළිතුරු වගු ගත කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරිමට සුදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පරීක්ෂා වලදී දේව වචනය තුළින් ජය ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 3.0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 6.3.3** : ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයෙන් දිරියක් ලබයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ලබා දෙන කැඳවීම විස්තර කරයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය පිළි ගනියි.
- චිත්‍ර කතාවක් නිර්මාණය කරයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේ දේව සේවයට අප ව කැඳවන බව විශ්වාස කරයි.
- අන් අයට සුභාරංචි ය ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පංතියට ගෙන එන ලද සුභාරංචි අත් පත්‍රිකා සිසුන්ට ලබා දෙන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු මතු කරමින් සිසුන් සමග සාකච්ඡාවකට පිවිසෙන්න
  - සුභාරංචි රැස්වීම් විවිධ ස්ථානවල පැවැත්වෙන බව.
  - සුභාරංචි රැස්වීම් සඳහා බොහෝ අය සහභාගී වන බව.
  - සුභාරංචි රැස්වීම් තුළින් ජේසුස් වහන්සේ හඳුනා ගත හැකි බව.

(මිනිත්තු 20)

පියවර 2

- ක්‍රියා 8 : 26 - 40 බයිබල් කොටස පන්තියට ඉදිරිපත් කරන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්ය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න .
- සියලු අදහස් ගොනු කරමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - ශුද්ධාත්මයාණන් වහන්සේ පිලිප් තුමා ගාසාවට ගෙන ගිය බව. ක්‍රියා 8 : 26
  - පිලිප් තුමාට අන්‍ය ජාතිකයකු මුණ ගැසුණු බව. ක්‍රියා 8 : 27
  - රථයේ සිටි තැනැත්තා යෙසායාගේ පොත කියවමින් සිටි බව. ක්‍රියා 8:28
  - පිලිප් තුමා ඔහු සමඟ සිට එය පහදා දුන් බව. ක්‍රියා 8 : 30-36
  - අන්‍ය ජාතික මිනිසා ජේසුස් වහන්සේ ව හඳුනා ගැනීම. ක්‍රියා 8 : 37
  - පිලිප්තුමා අන්‍ය ජාතික තැනැත්තාව බෞතීස්ම කිරීම. ක්‍රියා 8 : 38
  - ශුද්ධාත්මයාණන් වහන්සේ අප සේවය ට කැඳවන බව.
  - අප ජේසුස් වහන්සේ ව සමාජයට හඳුන්වා දීමට යොමු විය යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ක්‍රියා 8: 26 - 40
සුභාරංචි රැස්වීම් පිළිබඳ අත් පත්‍රිකා
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**ක්‍රියා 8 : 26 - 40** බයිබල් පාඨය හොඳින් කියවන්න .

එය මෙනෙහි කරන්න

ඒ ඇසුරින් අවස්ථා 6ක් නිරූපණය වන සේ **චිත්‍ර කථාවක්** නිර්මාණය කරන්න.

නිර්මාණය කරන ලද චිත්‍ර කථා පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සුභාරංචි රැස්වීම් සඳහා දරුවන් සහභාගී කර වන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.4.1 :** දේව රාජ්‍යය තුළ ප්‍රේමයේ ඇති විශිෂ්ඨත්වය වටහා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- යහපත් සමාරිතයාගේ උපමාව තුළින් මතුවන ප්‍රේමය පිළිබඳ අදහස් පැහැදිලි කරයි.
- සැබෑ ප්‍රේමය දේව රාජ්‍යයේ වටිනා ගුණාංගයක් බව පිළි ගනියි.
- සැබෑ කිතුනු ප්‍රේමය පිළිබඳ ගීතිකාවක් නිර්මාණය කරයි.
- ප්‍රේමය තුළින් නිරතුරුවම අභියෝග ජය ගත හැකි බව විශ්වාස කරයි.
- පරාර්ථකාමී ලෙස සහය වීම තුළින් අන් අයට ප්‍රේම කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- කඩදාසි හා පෑන් ලබා දී ප්‍රේමය පිළිබඳ සෑම සිසුවකු ම දරන හොඳම අදහස එහි ලියා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ප්‍රේමය දෙවියන් වහන්සේගෙන් ලබන දායාදයක් බව.
    - ප්‍රේමය වටිනා කිතුනු ගුණාංගයක් බව
    - සෑම කෙනකුට ම ප්‍රේමය අත්‍යවශ්‍ය බව.
    - අන් අයට උදව් කිරීම තුළින් ප්‍රේමය දැක්විය හැකි බව.

(මිනිත්තු 15)

පියවර 2

- ශු. ලූක් 10:25-37 ශුද්ධ බයිබල් පාඨය පන්තියට ඉදිරිපත් කරන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව ලබා සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න
    - යහපත් සමාරිතයාගේ උපමාව ජේසුස් වහන්සේ ඉගැන්වූ වටිනා උපමාවක් බව. ශු. ලූක් 10: 25-37
    - ජුදෙව් හා සමාරීය ජාතීන් අතර පැවති අසමගිය.
    - පරිසිවරුන් හා ලෙවීවරුන් පවා පරාර්ථකාමී ප්‍රේමයේ නියම අරුත වටහා නොගත් බව.
    - අපට හමුවන සෑම කෙනකු පිළිබඳව ම නිරන්තරයෙන් අපගේ සැලකිල්ල යොමු විය යුතු බව.

- තරාතිරම් නොබලා ප්‍රේමයෙන් අන් අයට සහය වීමේ වැදගත්කම
- ජේසුස් වහන්සේගේ ආදර්ශය තුළ නියම කිතුනු ප්‍රේමය අප ජීවිත තුළ වර්ධනය කර ගත යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 10:25-37
A4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

### ගවේෂණය සඳහා උපදෙස්

**ශු. ලූක් 10:25-37** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න.

ඒ ඇසුරු කරගෙන **සැබෑ කිතුනු ප්‍රේමය පිළිබඳ ගීතිකාවක්** නිර්මාණය කරන්න.

උචිත තාලයකට අනුව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

හද තුල රජ කරනා
සිත මන්මත් කරනා
දයාබරයි සොඳුරුයි ප්‍රේමය
දෙවිඳුන්ගෙන් ලැබුණා

සැම විට සිතනට යහපත් දේ
අනුනට යහපත සලසන සේ
පණ පොවනා අගනා ප්‍රේමය
දිවියට ලබමු තොසේ

කිතු දරුවන් සැවොමා
කිතු හිමි පසු පසිනා
පිය නගනෙමු වඩමින් ප්‍රේමය
දෙව් දරුවන් ලෙසිනා

**ගෙදර පරිසරයෙන්**

සැමවිට ම ප්‍රේමයෙන් කටයුතු කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.4.2 :** දේවරාජ්‍යයේ පුරවැසියකු ලෙස ඇදහිල්ලේ බලය අත් දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- අන්ධ මිනිසා සුවය ලැබීමේ සිදුවීම විස්තර කරයි.
- ඇදහිල්ලේ ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනියි.
- ඇදහිල්ල වර්ධනය කරන ලෙස අයදින යැදුමක් රචනා කරයි.
- ඇදහිල්ල තුළින් ප්‍රාතිහාර්ය අත්දැකිය හැකි බව විශ්වාස කරයි.
- දේව ඇදහිල්ල අන් අය තුළ වර්ධනය කිරීමට ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ජේසුස් වහන්සේගේ සුව කිරීම් දැක්වෙන චිත්‍ර ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ ව අදහස් පළ කිරීමට යොමු කර වන්න.
- අන්ධ මිනිසකු සුව කිරීමේ චිත්‍රය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කොට සෑම සිසුවකුට ම ඒ පිළිබඳ ව අදහසක් ලියා දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - අන්ධ මිනිසා සුවය ලැබීමේ අපේක්ෂාවෙන් සිටීම.
    - ජේසුස් වහන්සේ ඔහුට කතා කිරීම තුළින් ඔහු සතුටු වන්නට ඇති බව.
    - බොහෝ දෙනකු මෙම ප්‍රාතිහාර්යට සාක්ෂිකරුවන් වීම.
    - අන්ධ මිනිසා ඇදහිල්ල තුළින් සුවය ලැබීම.

(මිනිත්තු 10)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 30 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ මුණ ගැසීම තුළ අන්ධ මිනිසාට බලාපොරොත්තුවක් ඇති වූ බව
    - අන්ධ මිනිසාගේ ඇදහිල්ල හරහා ඔහුගේ සුවයේ බලාපොරොත්තුව සඵලවත් වූ අයුරු ශු. මාක් 10 : 47-50
    - ඇදහිල්ල දේව රාජ්‍යයේ පුරවැසියකුට අත්‍යවශ්‍ය ම ගුණාංගයක් බව.

- ඇදහිල්ලේ බලය තුළ කිතුනු ජීවිතයේ ප්‍රාතිහාර්ය අත්දැකිය හැකි බව.
- එදිනෙදා ජීවිතයේ දී කිතුනු ඇදහිල්ල වර්ධනය කර ගත යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. මාක් 10:46-52
A4 කඩදාසි හා මාකර් පෑන්
ජේසුස් වහන්සේගේ සුව කිරීම් දැක්වෙන චිත්‍ර කීපයක්
අන්ධ මිනිසකු සුව කිරීමේ චිත්‍රයක්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. මාක් 10:46-52** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න.

එම සිදුවීම අවබෝධ කර ගැනීම තුළ
**'අන්ධ මිනිසාට මෙන් ඇදහිල්ලක් මටත් දුන මැනව.'**
යන මාතෘකාවට අදාළ වන ලෙස යැදුමක් රචනා කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

රෝගීන් උදෙසා යාච්ඤා කිරීමට මග පෙන්වන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.4.3** :දේව රාජ්‍යයේ පුරවැසියකු ලෙස සමාව දානය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- නැතිවූ පුත්‍රයාගේ උපමාව පිළිබඳ කරුණු ගොනු කරයි.
- දෙවි පියාණන් වහන්සේ පසුතැවිලි වන අපට නිරතුරුව ම කමාව දානය කරන බව පිළි ගනියි.
- නැතිවූ පුත්‍රයාගේ උපමාව නිර්මාණාත්මක අයුරින් රඟ දක්වයි.
- කමාව දීම තුළින් ජීවිත ගොඩ නැගෙන බව විශ්වාස කරයි.
- කිතුනුවකු ලෙස එදිනෙදා ජීවිතයේදී අන් අයට කමාව දීමට යොමු වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 හි දැක්වෙන දෙබස සිසුන් තිදෙනෙකු ලවා පන්තියට ඉදිරිපත් කරවන්න
- ඒ ඇසුරෙන් පහත කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - කමාව වැදගත් කිතුනු ගුණාංගයක් බව.
    - ප්‍රේමය කමාව දීමට අප යොමු කරවන බව
    - කිතුනුවන් ලෙස අප අන් අයට කමාව දිය යුතු බව

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 30 )

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - පුත්‍රයා තමාට හිමි කොටස රැගෙන පියාගෙන් ද ගෙදරින් ද සමු ගෙන ගිය අයුරු. ශු. ලූක් 15:11-13
    - මිතුරන් සමග එක්වී සියල්ල නැති නාස්ති කර ගනිමින් ජීවත් වූ බව. ශු. ලූක් 15:14
    - තම වැරදි අවබෝධ කර ගත් විට ඒ පිළිබඳ ව මනස්ථාපනය වූ බව. ශු. ලූක් 15:17-19
    - නැතිවූ පුත්‍රයා නැවත නිවසට පැමිණි කළ පියා කමාව දී ආදරයෙන් පිළි ගත් බව. ශු. ලූක් 15:20-24
    - කමාව දීම දේව රාජ්‍යයේ වැදගත් වටිනාකමක් බව.

- පසුතැවීමෙන් අප කමාව අයදින විට සීමාරහිත ව දෙවි පියාණන් වහන්සේ අපට කමාව දෙන බව.
- කමාව දානය කිරීම තුළින් ජීවිත වෙනස් කළ හැකි බව.
- දේව රාජ්‍යයේ පුරවැසියකු ලෙස කමාව දානය කළ යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -ශු. ලූක් 15:11-32
A4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. ලූක් 15:11-32** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න. ඉන් මතු වන අදහස් පිළිබඳ ව අන් අය සමඟ සාකච්ඡා කරන්න.
**උපමාව රඟ දැක්වීමට** සූදානම් වන්න.

**ඇමුණුම 2**

අම්මා: මොකද අපේ චූටි පුතා පේන්න නැත්තේ
වෙනදා නම් ඉදිරියට ම දුවගෙන එන්නේ

අක්කා: අද නම් අම්මේ මල්ලී වරදක් කරලා
ඇඳ යට හැංගී සිටින්නේ ඔබ එයි කියලා

අම්මා: චූටි පුතා හනිකට ඉන්නා තැනකින් මෙහෙට එන්න
සිදු වූ දේ කිමදැයි දැන් ඇවිදින් මා හට කියන්න

මල්ලී: බෝලය උඩ දමමින් සෙල්ලම් කරනා විටදී මම
බෝලය වැදිලා කවුළුව බිඳුණා මට සමා වෙන්න

අම්මා: කා අතිනුත් අත් වැරදීම් වෙනවා පුතේ හිතට ගන්න
සමාව දෙනවා මම අද හිතා බලා වැඩ කරන්න.

මල්ලී : මගේ සුදු අම්මා මම නැහැ ආයෙත් දඟ වැඩ කරන්නේ
දේව පියා කියා තියෙන ලෙසිනුයි ජීවිතේ ගෙවන්නේ

**ගෙදර පරිසරයෙන්**

නිරතුරුව ම කමාව දීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.4.4 :** නිරතුරුව ම දෙවියන් වහන්සේට තුති පිදීමට යොමු වෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ලාදුරු රෝගීන් දස දෙනාගේ උපමාව විස්තර කරයි.
- නිරතුරුව ම දෙවියන් වහන්සේට තුති පිදිය යුතු බව පිළිගනියි.
- තුති පිදීමේ කාඩ් පතක් නිර්මාණය කරයි
- ස්තුතියි යන වදන එදිනෙදා ජීවිතය තුළ සැම විට ම භාවිත කරයි.
- අන් අය වෙතින් ලබන උපකාර සඳහා හද පත්ලෙන් ම තුති පුදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ස්තුති දීම අප ජීවිතවල ඇති කර ගත යුතු වැදගත් ගුණාංගයක් බව.
    - අප ලබන සැම ආශිර්වාදයකටම දෙවිඳුන්ට තුති පිදිය යුතු බව.
    - අන් අය අප හට සිදු කරන උපකාර සඳහා අප සැම විට ම ඔවුන්ට ස්තුතිවන්ත විය යුතු බව.

(මිනිත්තු 10)

පියවර 2

- ශු. ලූක් 17:11-19 දක්වා බයිබල් පාඨය පන්තියට ඉදිරිපත් කරන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 30)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ලාදුරු බෝවන රෝගයක් බව
    - ජේසුස් වහන්සේගේ කාලයේ ලාදුරු රෝගීන් සමාජයෙන් කොන් වූ ආකාරය
    - උන්වහන්සේ වෙත පැමිණි ලාදුරු රෝගීන් දස දෙනාම සුවය ලැබූ බව. ශු. ලූක් 17: 12-14
    - සුවය ලබා උන්වහන්සේට තුති පිදීමට නැවත හැරී පැමිණියේ සමාරිය ජාතික ලාදුරු රෝගියකු පමණක් බව ශු.ලූක් 17: 15-16
    - දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස නිරතුරුව ම අපි තුති පිදීමේ ජීවිත ගත කළ යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 17:11-19
බ්‍රිස්ටල් බෝඩ්
A4 කඩදාසි හා මාකර් පෑන්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් ඵළ සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. ලූක් 17 : 11-19** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න.

එම කථාවේ සඳහන් ජේසුස් වහන්සේට තුති පිදීමට හැරී ආ
**"සුවය අත් දුටු ලාදුරු රෝගියා"**
ඔබ යැයි සිතා උන්වහන්සේට තුති පිදීමේ කාඩ් පතක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

**ගීතාවලිය 136:1-9**

සමිඳුන් හට තුති පුදන්න එතුමාණෝ යහපත්ය
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

දේවාති දෙවිඳුන්ට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

රාජාති රජිඳුන්ට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

අසිරිමත් දේ කරන එකම තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

ප්‍රඥාවෙන් අහස මැවූ තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

ජල මතුයෙහි පොළොව මැවූ තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

ඉර හඳ මැවූ තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

දවාල පාලනය කිරීමට හිරු මැවූ තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

රාත්‍රිය පාලනය කිරීම සඳහා තාරකා මැවූ තැනැන් වහන්සේට තුති පුදන්න
එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේය

**ගෙදර පරිසරයෙන්**

දෙවියන් වහන්සේගෙන් ලැබෙන සියලු ම ආශිර්වාද ගැන තුති පුදන්නට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.4.5 :** නිහතමානී බව තම ජීවිතයට අත්පත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- යාච්ඤා කිරීමට ගිය පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාව සම්බන්ධ කරුණු ගොනු කරයි.
- නිහතමානීකම දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ලක්ෂණයක් බව පිළි ගනියි.
- නිර්මාණාත්මක පෝස්ටරයක් ඉදිරිපත් කරයි.
- නිහතමානීකම තුළින් යහපත් සමාජයක් ගොඩනැගිය හැකි බව විශ්වාස කරයි.
- නිහතමානීව ජීවත් වීම තුළින් අන් අයට ආදර්ශයක් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- 'නිහතමානීකම' යනුවෙන් ලියූ පුවරුව/චාට් සටහන පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට කඩදාසි හා මාකර් පෑන් ලබා දී එය පිළිබඳ සිසුන් දරන අදහස් කඩදාසි වල සටහන් කොට අදාළ චාට් සටහනේ පෙළ ගැස්වීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - නිහතමානීකම යනු යටහත් පහත් වීම බව.
    - ජේසුස් වහන්සේ නිහතමානිකම පිළිබඳ දේශනා කළ බව
    - නිහතමානීකම ජීවිතයේ ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් බව.

(මිනිත්තු 10)

පියවර 2

- ශු. ලූක් 18: 9-14 දක්වා ශුද්ධ බයිබල් පාඨය පන්තිය ඉදිරියේ කියවන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 30)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේගේ කාලයේ සිටි පරිසිවරු ජුදෙව් ආගමික කණ්ඩායමක් බව.
    - අයකැමියන් සමාජයෙන් ප්‍රතික්ෂේප වූ කොට්ඨාසයක් බව.
    - පරිසිවරයාගේ යැදුම තුළින් උඩගු බව මතුවන ආකාරය. ශු. ලූක් 18: 11-12
    - අයකැමියාගේ යැදුම තුළින් නිහතමානි බව මතුවන අයුරු. ශු. ලූක් 18: 13
    - දේව ප්‍රශංසාවට ලක්වන්නේ නිහතමානී යැදුම් බව. ශු. ලූක් 18: 14

- සමාජය තුළ අප නිහතමානි වීම සඳහා ආදර්ශවත් විය යුතු බව.

- ජේසුස් වහන්සේ මෙන් අප ද නිහතමානීව දිවි ගෙවීම තුළින් යහපත් සමාජයක් ගොඩ නැගිය හැකි බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. ලූක් 18:9-14
A4 කඩදාසි හා මාකර් පෑන්
'නිහතමානිකම' යනුවෙන් ලියූ වර්ණවත් පුවරුවක්/චාට් සටහනක්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**ශු. ලූක් 18 : 9-14** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න.

ඒ ඇසුරෙන්

**'අයකැමියා අපට උගන්වන නිහතමානීකම'**

මාතෘකාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

නිහතමානී ව අන් අය සමග ජීවත් වීමට හුරු කරවන්න.

**නිපුණතාව 5.0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.5.1** : ශුද්ධ බයිබලයේ සැකැස්ම පැහැදිලි කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**
- ශුද්ධ බයිබලය වර්ගීකරණය කරයි
- ශුද්ධ බයිබලයේ ඇති දෙව් වදන් පිළි ගනියි.
- ශුද්ධ බයිබලයේ වර්ගීකරණය පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරයි.
- ශුද්ධ බයිබලයේ ආදර්ශ හා උපදෙස් අනුගමනය කරයි.
- ශුද්ධ බයිබලයට අනුකූලව ජීවිතය ගත කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1
- ගෙනෙන ලද බයිබලය සිසුන් අතට පත් කරන්න.
- එය පෙරලා බලා එහි තිබෙන පටුන ආශ්‍රයෙන් බයිබලයේ පොත් වල නම් හඳුනා ගැනීමට සහය වන්න
- ඒ ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ශුද්ධ බයිබලය වටිනා පොතක් බව.
  - එහි පොත් ගණනාවක් ඇති බව.
  - ශුද්ධ බයිබලයේ සම්පූර්ණ පොත් ගණන 66 ක් බව.
  - එය ප්‍රධාන කොටස් 2 කට වෙන් කළ හැකි බව.
  - පැරණි ගිවිසුම හා නව ගිවිසුම යනුවෙන් කොටස් 2 කට බෙදා ඇති බව

(මිනිත්තු 20)

පියවර 2
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - පැරණි ගිවිසුම ට පොත් 39 ක් හා නව ගිවිසුම ට පොත් 27 ක් ඇතුලත් බව.
  - පැරණි ගිවිසුමේ පළමු පොත් 5 පංච පුස්තකය ලෙසත්, නව ගිවිසුමේ මුල් පොත් 4 ශුභාරංචි පොත් ලෙසත් හඳුන්වන බව
  - ශුද්ධ බයිබලයේ පළමු පොත උත්පත්ති සහ අවසන් පොත එළිදරව් බව .
  - පොත් ගණනාවක් තිබුණද එය ලියා ඇත්තේ එකම තේමාවක් මුල් කරගෙන බව.
  - ශුද්ධ බයිබලය තුළ ඇත්තේ දේව වචනය බව.
  - කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය ශුද්ධ බයිබලය බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය
බ්‍රිස්ටල් බෝඩ්
මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

### ගවේෂණය සඳහා උපදෙස්

ශුද්ධ බයිබලයේ සැකැස්ම පිළිබඳ හොඳින් අධ්‍යයනය කරන්න

ශුද්ධ බයිබල් වර්ගීකරණය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.

ඒ ඇසුරෙන් **ශුද්ධ බයිබලයේ වර්ගීකරණය** පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා බයිබලය කියවීමට දරුවන් යොමු කරවන්න

**නිපුණතාව 5.0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.5.2 :** ශුද්ධ බයිබලයේ විශිෂ්ඨත්වය හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ශුද්ධ බයිබලය නිවැරදි ව කියවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- දේව වචනය කියවීමෙන් දේව මග පෙන්වීම ලැබෙන බව පිළි ගනියි.
- ශුද්ධ බයිබලයෙන් ලැබෙන උපදේශ පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරයි.
- දේව වචනය ජීවමාන බව විශ්වාස කරයි.
- ශුද්ධ බයිබලය තුළින් ලබා දෙන මග පෙන්වීම තුළ අන්‍යොන්‍ය සහයෝගයෙන් ජීවත් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ශුද්ධ බයිබලය සිසුන් අතට පත් කර සිසුවාට තමන් වඩාත් කැමති බයිබල් පදයක් තෝරා ගන්නට අවස්ථාව දෙන්න.
- එම බයිබල් පදයට වඩාත් කැමති මන්දැ යි එක් එක් දරුවාගෙන් විමසමින් ශුද්ධ බයිබලයෙන් ලබන මගපෙන්වීම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - බයිබල් පාඨයෙන් ආදර්ශයක් ලබන බව.
    - බයිබල් පාඨයෙන් උපදේශයක් ලබන බව.
    - ජීවිතයට අදාළ කරගත හැකි බව

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - ශුද්ධ බයිබලය තුළින් ජීවමාන මගපෙන්වීමක් ලැබෙන බව
    - ශුද්ධ බයිබලය තුළින් අපගේ ජීවිත ආලෝකවත් වන බව
    - නිරතුරුවම දේව වචනය තුළින් දේව මග පෙන්වීම සෙවිය යුතු බව.
    - සතුටේ දී, දුකේ දී, වේදනාවේ දී දේව වචනය අප දිරිමත් කරන බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

### ඇමුණුම 1

### ගවේෂණය සඳහා උපදෙස්

බයිබලය තුළ අන්තර්ගත පැරණි ගිවිසුමේ සඳහන් **"උපදේශ වැකි"** එකතු කරන්න.

ජීවිතය යහපත් කරගැනීමට නව ගිවිසුම තුළින් ඉදිරිපත් කරන **"ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්"** එකතු කරන්න.

ඒවා A4 කඩදාසියක පෙළ ගස්වන්න.

ඒවා ඇතුලත් කරමින් **පොත් පිංචක්** නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ජීවිත අභියෝග වලදී දේව වචනය කියවමින් ධෛර්යය ලබාගැනීමට දරුවන් හුරු කරවන්න.

**නිපුණතාව 5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.5:3** : දාවිත් තුළින් දිවියට සවියක් ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- දාවිත් තුළ දෙවියන් වහන්සේ පිළිබඳ තිබුනා වූ විශ්වාසය පිළිබඳ කරුණු ගොනු කරයි.
- අභියෝග ජය ගැනීමට දෙවියන් වහන්සේගෙන් අපට ශක්තිය ලැබෙන බව පිළිගනියි.
- දාවිත් තුළ දෙවියන් වහන්සේ පිළිබඳ ව තිබුණා වූ විශ්වාසය ප්‍රකාශ වන වැකි නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- දෙවිඳුන්ගේ නාමයෙන් ජයගත හැකි බව විශ්වාස කරයි.
- තරාතිරම් නොබලා කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- 'ඇමුණුම 2 සිසුන් අතට ලබා දෙන්න.
- එය තාලයට අනුව ගායනා කරවන්න.
- එමගින් ඉස්මතු වන කරුණු පිළිබඳ මෙනෙහි කිරීමට කාලය ලබා දෙන්න.
- පහත කරුනු ඉස්මතු වන සේ සාකච්ඡාවක නිරත වන්න.
    - දෙවියන් වහන්සේ අප ආරක්ෂා කරන බව.
    - දෙවියන් වහන්සේ අපට මඟ පෙන්වන බව.
    - දෙවියන් වහන්සේ සතුරන් ඉදිරියේ අප රැක ගන්නා බව.
    - දෙවියන් වහන්සේ අප පෝෂණය කරන බව.

(මිනිත්තු 30)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු50)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - දාවිත් එඩේරෙක් බව
    - දාවිත් දෙවියන් වහන්සේට ආදරය කළ බව.
    - දාවිත් අභියෝග ජයගත් බව.

- දෙවියන් වහන්සේ දාවිත් අත් නොහැරිය බව. 1 සාමුවෙල් 17:37
- දෙවියන් වහන්සේගේ නාමයෙන් ජය අත් කර ගත් බව.
  1 සාමුවෙල් 17: 45,47
- අපව ශක්තිමත් කරන බව.
- අපගේ තරාතිරම් නොබලා දේව අභිප්‍රාය ඉටු කිරීමට අප තෝරා ගන්නා බව.
  (මිනිත්තු 40 )

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - 1 සාමුවෙල් 17:37-40, 45, 47
A4 කඩදාසි
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාලව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ඔබේ කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.

එම පාඨයෙන් මතු වන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය සමග සාකච්ඡා කරන්න.

ඒ ඇසුරෙන් නිර්මාණාත්මක ක්‍රියාකාරකමේ නිරත වන්න.

| 1 කණ්ඩායම | 2 කණ්ඩායම | 3 කණ්ඩායම |
|---|---|---|
| **1 සාමුවෙල් 17:37-40** | **1 සාමුවෙල් 17:45** | **1 සාමුවෙල් 17:47** |
| (චිත්‍රයක් අඳින්න) | (මෙහි දැක්වෙන අදහස නිර්මාණාත්මකව ලියන්න) | (පොත් සලකුණක් සාදන්න) |

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

1. හිමි මාගේ එඬේරා ය
   මට හිඟ නො වෙයි
   සැනැසිලි ගෙන දේ ය
   පෙමින් මඟ පෙන්වයි

2. ආත්මෙට මා පුබුදුවා
   දමිටු මංවල
   ගෙන යමින් දයා පෙන්වා
   දෙයි සෙත් සුවිපුල

3. ඔබ මා සමඟ බැවින්
   මරු සෙවණේ දීත්
   බිය නොවෙමි නොපැකිළෙමි
   කුමන දුක් ආවත්

4. ඔබගේ සැරයටියත්
   ඔබගේ කෙවිටත්
   සුව පහසු මට දෙයි
   අනතුරක් නො වෙයි

5. ඉදිරියෙහි සතුරන්
   සරසා දෙයි බොදුන්
   අලෙවු කෙලේය තෙලින්
   ඉතිරෙයි පැන් බඳුන්

6. යාපත්කමත් කරුණාවත්
   ළඟ ම යි මා දිවිහිමි
   දෙව් නිවෙසෙහි සිරිමත්
   සැම දා වසන්නෙමි

**ගෙදර පරිසරයෙන්**

තීරණ ගැනීමේදී දේව මග පෙන්වීම සෙවීමට යොමු කරවන්න.

**නිපුණතාව 5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.5:4 :** සහෝදර ප්‍රේමයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- මීරියම් තුළ තිබුණා වූ යහපත් ගුණාංග විස්තර කරයි.
- නිරතුරුව දේව ආරක්ෂාව ලැබෙන බව පිළි ගනියි.
- මීරියම්ගේ චරිත කථාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- අභියෝග හමුවේ උපක්‍රමශීලීව කටයුතු කරයි.
- සමාජය තුළ සහෝදරත්වයෙන් හා සහයෝගයෙන් ජීවත් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ගෙනෙන ලද පින්තූර පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - මීරියම් මෝසෙස්ගේ සහෝදරිය බව
    - මීරියම් තම සහෝදරයා වන මෝසෙස්ට ආදරය කළ බව.
    - විපතේදී තම සහෝදරයා රැක බලා ගත් බව.

(මිනිත්තු 20)

පියවර 2

- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - මීරියම් සහෝදර ප්‍රේමයෙන් කටයුතු කළ බව - නික්මයාම 2: 5-9
    - රාජ අණ මධ්‍යයේ ක්‍රියා කිරීමට ඇය තුළ තිබූ නිර්භීතකම.
    - තම සොහොයුරාට සොයුරියක් මෙන්ම මවක් ද වූ බව.
    - ඇය උපක්‍රමශීලී ව කටයුතු කළ බව.
    - දෙවියන් වහන්සේගේ නාමයෙන් ජය අත් කරගත් බව.
    - අප ද සහෝදරත්වයෙන් කටයුතු කළ යුතු බව.
    - සමාජයේදී ද අන් අයට අප උපකාර කළ යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -නික්මයාම 2:5-9
මීරියම්ගේ චරිත කථාවට අදාල සිද්ධීන් ඇතුලත් විශාල පින්තූර කීපයක්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**නික්මයාම 2:5-9** බයිබල් කොටස කියවන්න.

ඒ පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.

**මීරියම්ගේ චරිත කථාව** චිත්‍ර කථාවක් ඇසුරෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්**

සමාජය තුළ ජීවත් වන විට සහෝදරත්වයෙන් යුතුව ජීවත් වීමට මග පෙන් වන්න.

**නිපුණතාව 5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 6.5.5** දේව හඬට සවන් දීමට හුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- සාමුවෙල්ගේ කැඳවීමට අදාළ කරුණු ගොනු කරයි
- දෙවියන් වහන්සේගේ හඬට සවන් දිය යුතු බව පිළිගනියි.
- සාමුවෙල්ගේ කතාවට අදාල චිත්‍ර නිර්මාණය කරයි.
- දෙවියන් වහන්සේගේ හඬට කීකරු වෙයි.
- සාමූහික නමස්කාරයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පෙර පුහුණුවකින් යුතුව ඇමුණුම 2 පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ස්වාමින් වහන්සේ අපට කතා කරන බව
    - අප උන්වහන්සේගේ හඬට සවන් දිය යුතු බව.
    - දේව හඬට ප්‍රතිචාර දැක්විය යුතු බව.
    - උන්වහන්සේගේ මෙහෙකරුවකු වීමට අප කැඳවන බව.

(මිනිත්තු 20)

පියවර 2

- 1 සාමුවෙල් 3: 1-10 බයිබල් කොටස සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කරවන්න.
- ශුද්ධ බයිබලය හා ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න. (ඇමුණුම 1)
- කාර්යය පවරා සිසුන් ගවේෂණයෙ හි යොදවන්න.
- අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් සිසුන්ට අදහස් පළ කිරීමට අවස්ථාව සලසන්න.
- සියලු අදහස් ගොනු කරමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
    - සාමුවෙල් කුඩා කල සිට ම දේවස්ථාන සේවයේ යෙදුන බව
      1 සාමුවෙල් 3:1
    - නිතර දෙවියන් වහන්සේ සමග සංවාදයේ යෙදුන බව.
      1 සාමුවෙල් 3:2-10
    - කුඩා කළ සිට ම අප ද දේව නමස්කාරයේ යෙදිය යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය 1 සාමුවෙල් 3:1-10
කුඩා සාමුවෙල් යාච්ඤා කරමින් සිටින පින්තූරයක්
ඇමුණුම 1
ඇමුණුම 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

**1 සාමුවෙල් 3 : 1 - 10** බයිබල් කොටස අවබෝධයෙන් කියවන්න.

**සාමුවෙල්ගේ කතාවේ** ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගා එය වර්ණ ගන්වන්න.

ඔබගේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

**-දෙබස-**

දේව හඬ - සාමුවෙල්..... සාමුවෙල්...

සාමුවෙල් - පූජකතුමනි ඔබ මට කතා කළාද? මගේ නම කියා මටකතා කරනවා ඇහුණා.

ඒලී පූජක - නැහැ මම හඬ ගැසුවෙ නැහැ. ඔබ ගොස් නිදාගන්න.

දේව හඬ - සාමුවෙල්, සාමුවෙල්

සාමුවෙල් - ඇත්තටම ඔබ මට කතා කළාද . මෙන්න මම ආවා.

ඒලී පූජක - මාගේ පුත්‍රය මම අඬගැසුවේ නැහැ. ගිහින් නැවත නිදාගන්න.

දේව හඬ - සාමුවෙල්, සාමුවෙල්....

සාමුවෙල් - පූජකතුමනි. ඔබ මට නම කියල ම කතා කළා. මට ඒක හොඳටම ඇහුණා.

ඒලි පූජක - ඔබ ගොස් නිදාගන්න. නැවත කතා කරනවා ඇසුනොත් "ස්වාමිනී මම මෙහිය. කතා කළ මැනව. ඔබේ මෙහෙකරුවා අසා සිටිනවා ඇත" කියා කියන්න.

දේව හඬ - සාමුවෙල්, සාමුවෙල්

සාමුවෙල් - 'ස්වාමිනී කතා කළ මැනව, ඔබගේ දාසයා අසා සිටිනු ඇත.

**ගෙදර පරිසරයෙන්**

දේව වදනට කීකරු වීමට මග පෙන්වන්න.

## විවිධ සහය

| | |
|---|---|
| පරිසණක වදන් සැකසුම: | ෂර්වෝන් මෙන්ඩිස් |
| කාර්යාලයීය කටයුතු : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>ගාමිණී රෝහණ විමලසේන මහතා<br>ඩයස් අමරසිංහ මහතා<br>නිල්මිණී ප්‍රනාන්දු මහත්මිය |